www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව පලාත් පාලන මැතිවරන දිනීමේ ප්‍රචන්ඩ වෑයමක

## Sri Lankan government in desperate bid to win local elections

**එම්. වසන්තන් විසිනි**
**2009 ජුලි 20**

අගෝස්තු මාසයේ පැවැත්වෙන පලාත් පාලන මැතිවරනය සඳහා පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) ජය තහවුරු කිරීමේ අපේක්ෂාවෙන් ආන්ඩුවේ ඇමතිවරු මෑත සති කිහිපය තුල යාපනයේ සංචාරය කලහ. යාපනය මහ නගර සභා සහ වව්නියා නගර සභා මැතිවරනය අගෝස්තු 8 වන දින පැවැත්වීමට නියමිතය.

රජයේ හමුදාවන් විසින් එල්ටීටීඊය පරාජය කිරීමෙන් අනතුරුව තවදුරටත් දිවයිනේ උතුරෙහි පාලනය යුද හමුදාව විසින් අත්පත් කර ගෙන සිටීම වසන් කරන ප්‍රජාතන්ත්‍රවාදී මවාපෑමක් සඳහා ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මෙම මැතිවරන කැඳවා ඇත.

සිවිල් යුද්ධයේ කුරිරු අවසානය පිලිබඳවත් 300,000 ක් සාමාන්‍ය දෙමල වැසියන් කඳවුරු තුල සිරකර තැබීම පිලිබඳවත් ප්‍රචලිත එදිරිවාදිකම් පවතිද්දී ම, හිස් පොරොන්දු හා සෘජු බියවැද්දීම් හරහා ආන්ඩුව ඡන්දදායකයන්ගේ සහයෝගය දිනාගැනීමට උත්සාහ කරමින් සිටී.

සමස්තයක් ලෙස යාපනය අර්ධද්වීපයත් යාපනය නගරයත් හමුදා රැඳවුම් පොලකි. ආසන්න වශයෙන් දශක තුනක් තිස්සේ එය පූර්න හමුදා ග්‍රහනයට නතු වී පැවතිනි. ශ්‍රී ලංකා හමුදාවත්, එල්ටීටීඊයත් තවත් අවස්ථාවක 1987 කොලඹ හා නවදිල්ලි ආන්ඩු අතර ඇති කර ගත් ඉන්දු-ලංකා ගිවිසුම යටතේ පැමිනි ඉන්දියානු සාම හමුදාවත් එය වසා සිටියේය.

මේ වන විට හමුදාවේ 51 වන බලකාය යාපනය නගරය මධ්‍යයේ රඳවා ඇති අතර ඒ සඳහා ප්‍රධාන හෝටලයක් සහ අසල්වැසි නිවාස 50 ක් බලෙන් ලබා ගෙන ඇත. අවට මුලු ප්‍රදේශයම අධිආරක්ෂක කලාපයක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇත. තවත් හමුදා කඳවුරක් මහ නගරසභා ප්‍රදේශයට ම අයත් ගුරු නගර් ප්‍රදේශයේ පිහිටුවා ඇති අතර එහි සියගනන් ධීවරයින්ගේ නිවාස අත්පත් කර ගෙන තිබේ. සෑම හන්දියක ම හමුදා භටයින් යොදවා ඇති අතර මේ ප්‍රදේශ දෙකේම පයින් හා වාහන වලින් යන මගීන් සෝදිසි කිරීම සුලභ දසුනකි.

සමාජ සේවා අමාත්‍ය හා ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (ඊපීඩීපී) නායක ඩග්ලස් දේවානන්ද ආන්ඩුවේ මැතිවරන ව්‍යාපාරය වෙනුවෙන් යාපනය භාරව කටයුතු කරයි. ඊපීඩීපීය කොලඹ පාලක සභාගයේ කොටසක් වුවද එය එජනිස යටතේ මැතිරනයට පෙනී සිටීමට එකඟ වූයේ වැඩි කැමැත්තකින් නොවේ. යාපනය තුල රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) සැලකිය යුතු දේශපාලන පදනමක් නැති අතර එජනිස ආසන 29 කින් 20 ක්ම ඊපීඩීපීයට ලබා දී තිබේ.

එජනිසයේ මැතිවරන ව්‍යාපාරය දැඩි රැකවල් මධ්‍යයේ සිදුවෙයි. සෑම ඇමතිවරයකුට ම සන්නද්ධ මෝටර් රථ ඇතුලු හමුදා රථ පහ හයකින් ආරක්ෂාව සපයනු ලැබේ. ප්‍රාදේශීය ජනතාව තුල තව තවත් පිලිකුල වර්ධනය කරමින් මෙම වාහන වලට මාර්ගය ඉඩ සැලසීම සඳහා රථවාහන නැවැත්වීමට බල කෙරේ.

ජුලි 10 දින වීරසිංහම් ශාලාවේ දී පැවති ධීවරයන්ගේ රැස්වීමේ දී එජනිසට ඇති විරෝධය පිලිබඳ යථා ඇඟවීම් දක්නට තිබුනි. යුද්ධය අවසන් බැවින් ධීවරයන්ට අනාගතය දීප්තිමත් වනු ඇති බවට සභාවට ඒත්තු ගැන්වීමට ධීවර අමාත්‍ය ෆීලික්ස් පෙරේරා සමග දේවානන්ද උත්සාහයක යෙදුනි.

එක්වර ම ගුරුනගර් හි ධීවරයෙක් ප්‍රශ්නයක් යොමු කලේ ය. "හමුදාව අපේ ගෙවල් 230 ක් බලෙන් ලබාගෙන අධි ආරක්ෂක කලාපයන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒවා නැවත අපට ලබාදීමට ඔබට පියවර ගත හැකි ද? යුද්ධය අවසන් නිසා යාපනය හා කොලඹ යාකරන ඒ 9 මාර්ගය විවෘත කිරීමට ආන්ඩුව ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක් දැයි තවත් අයෙකු ඇසී ය.

පැහැදිලි ලෙස ම අන්ද මන්ද වූ පෙරේරා එම ප්‍රශ්නය මඟහරිමින් ප්‍රකාශ කලේ, "ඒවා රාජ්‍ය ආරක්ෂාව පිලිබඳ ප්‍රශ්න නිසා ඒ සම්බන්ධව මට කිසිවක් කරන්න බැහැ. වෙනත් ප්‍රශ්න අහන්න" යනුවෙනි. කෙසේ නමුත් ධීවරයන් කිහිප දෙනෙක් පිලිතුරු ලෙස කියා සිටියේ,

"අපගේ සෑම ප්‍රශ්නයක්ම හමුදාවේ ක්‍රියා කලාපය සමග බැඳී තිබෙනවා. අපට මේ කාරනා පිලිබඳව අහන්න බැරි නම්, කුමන ප්‍රශ්නද ඇසිය හැක්කේ?"

තවත් අමාත්‍යවරුන් තිදෙනෙක් වන බන්දුල ගුනවර්ධන, තිස්ස කරලියද්ද, සහ මහින්දානන්ද අලුත්ගමගේ විසින් අධික බඩු මිල පිලිබඳ විරෝධය සමනය කිරීම සඳහා යාපනය වානිජ සභාව මුන ගැසුනු අතර සුලු හා මධ්‍යම පරිමාන වෙලෙන්දන් ද මුන ගැසුනහ. වෙලඳ අමාත්‍ය ගුනවර්ධන යාපයේ බඩු මිල ගනන් පිලිබඳ "විමතිය" පලකල නමුත් එහි අභිරහසක් නැත. දැඩි ආරක්ෂක තහංචි ඇතුලු මාර්ග පහසුකම් හිඟවීම මූලික අත්‍යවශ්‍ය භාන්ඩවල මිල පවා ඉහල දමා ඇත.

ව්‍යාප්තව ඇති අවිශ්වාසය හමුවේ එල්ටීටීඊයට විරෝධය පාමින් යුද්ධයට සහාය දුන් ටියූඑල්එෆ් ඇතුලු විරුද්ධ පක්ෂවලට ප්‍රහාර එල්ල කිරීමටත් බිය වැද්දීම් කිරීමටත් ආන්ඩුව යොමු වී සිටී. ටියූඑල්එෆ් හි නායක වී. ආනන්ද සංගරී *ලෝක සමාජවාදී වෙබ් අඩවියට (ලොසවෙඅ)* පැවසුවේ ටියූඑල්එෆ් හි ප්‍රධාන ඡන්ද අපේක්ෂකයන් කිහිප දෙනෙකුටම මැතිවරයෙන් ඉවත්වන ලෙස තර්ජනය කරමින් දුරකථන ඇමතුම් ලැබුනු බවයි.

යාපනය නගරයේ ටියූඑල්එෆ් හි පෝස්ටර් පුවරු ඉරා දමා හෝ කලු තීන්ත ගා හානි කොට ඇත. නමුත් දෙවානන්දගේ සිනාමුසු මුහුන රැගත් ඊපීඩීපී යේ දැන්වීම් පුවරු හානියකින් තොරව පවතිනු දැකිය හැකිය. වීදි පුරා විශාල වශයෙන් හමුදාව හා පොලීසිය යොදවා ඇති තත්ත්වයක් යටතේ මේ සිදුවීම් වලින් පැහැදිලි වන්නේ හමුදාව පැහැදිලිව ම ආන්ඩුව පැත්ත ගෙන සිටින බවයි. ඊපීඩීපීයට සන්නද්ධ කල්ලියක් පවතින අතර ඔවුහු යුද්ධය පවතින වකවානුවේ යාපනය හා අවට දූපත්වල යුදහමුදාව සමග ඉතා ලඟින් කටයුතු කලේ ය.

ප්‍රධාන විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) යාපනයේ මැතිවරනය සඳහා ජුලි 15 දින කොලඹ දී තම මැතිවරන ව්‍යාපාරය ආරම්භ කලේ ය. එජාපයේ නායක රනිල් වික්‍රමසිංහ මාධ්‍ය සමුලුවක දී පැවසුවේ; "අන් සෑම පක්ෂයකට ම වඩා දෙමල ජනතාවට වඩාත්ම සමීප පක්ෂය එජාපය බව යි. ලඟදී එන පලාත් පාලන මැතිවරනවල දී අපව තෝරාපත් කරගත හොත් උතුරට සාමය හා සාමාන්‍ය වාතාවරනය ගෙන ඒමට අපට හැකිය." යනුවෙනි.

කෙසේ නමුත්, එජාපය 1983 දී යුද්ධය ආරම්භ කිරීමටත් දශක ගනනාවක් එය උග්‍ර කිරීමටත් වගකිව යුතු වන්නේය. එල්ටීටීඊය සමග 2001 දී සටන් විරාමයක් අත්සන් කල ද 2006 න් පසුව එය රාජපක්ෂ නැවත ආරම්භ කල යුද්ධයට සහාය පලකල අතර මේ වසරේ දී එල්ටීටීඊයට එරෙහිව හමුදාවේ යුදමය ජයග්‍රහනය මහත් හරසරින් පිලිගත්තේ ය.

එජාපයේ ප්‍රධාන ආපේක්ෂක සත්යේන්ද්‍රන් විසින් යුද්ධයෙන් විනාශ වුනු යාපනය බස් නැවතුම් පල හා කඩපොල නැවත සංවර්ධනය කිරීමටත් යාපනය පුස්තකාලයේ වැඩ අවසන් කිරීමටත් පොරොන්දු දී ඇත. 1981 දී එජාපයේ මැරයන් විසින් යාපනය පුස්තකාලයේ තිබූ දුර්ලභ පොත් හා අත්පිටපත් විශාල සංඛ්‍යාවක් සමග පුස්තකාලය ගිනිබත් කරන ලදී.

ඊලඟ මාසයේ පැවැත්වෙන මැතිවරනයට ඉදිරිපත් වන සෑම පක්ෂයක් පිලිබඳව ම යාපනයේ පුලුල් මහජන පිලිකුලක් දැකිය හැකිය.

යාපනය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සිසුවකු *ලෝසවෙඅය* ට තම කටුක අත්දැකීම් විස්තර කලේ ය. ඔහුගේ දෙමාපියන් යුද්ධය පැවති සමයේ කිහිප වරක්ම අවතැන් වූ ගොවීන් වන අතර දැන් ඔවුන් මැනික් ෆාර්ම් රැඳවුම් කඳවුරේ රඳවා තබනු ලැබ ඇත.

සිව්දරු මවක් වූ ඔහුගේ වැඩිමහල් සොහොයුරිය මාර්තු 5 වන දින හමුදාවේ ෂෙල් ප්‍රහාරයකින් මිය ගියා ය. "මගේ පවුලේ සිටින අය සිටින තැනැක් ගැන මට දැනගන්න ලැබුනේ ලඟදී. මගේ සහෝදරයන් එවූ ලිපියක් මඟිනුයි.... මුලදී මට එල්ටීටීඊ ය ගැන තිබුනේ වැරදි විශ්වාසයක්. මම හිතන්නේ දෙමල මිනිසුන්ට නව දැක්මක් හා පක්ෂයක් අවශ්‍යයි."

වයස 65 ක් වන යාපනයේ වැසියෙක් පැහැදිලි කලේ "අපි ජීවත් වෙන්නේ යාපනය නගර සභා සීමාව තුලයි. හැම මූලික පහසුකමක් ම මෙහි විනාශ වෙලා. මැතිවරනය ඊලඟ මාසේ එනවා. ඒත් ජල බද්දක් නොවැම්බර් මාසේ ඉදලා දාලා තියෙනවා. අපිට නල වතුර ඇත්තේ නෑ. පොදු ජල කරාමය තමයි භාවිතා කරන්නේ. ඒකට අපි රුපියල් 30 ක් මාසෙකට ගෙවන්න ඕනෑ.

"වහින කාලෙට කුනු වතුර ගෙවල් ඇතුලට එනවා. කලින් තිබුනු කානු ටිකත් යුද්දේ නිසා විනාශ වෙලා, නැත්තම් අත්හැර දමලා. යාපනේ යුද්දෙට කලින් හිටිය මිනිස්සුන්ගෙන් භාගෙකටත් වැඩිය එක්කෝ රට ගිහින් නැත්නම් වෙනත් ප්‍රදේශවලට ගිහින්. හානිවෙච්ච පාරවල් වත් ගොඩනැගිලි වත් පිලිසකර කර නෑ."

මැදිවියේ කාන්තාවක් කීවේ "ඇමතිවරු එනවා, යනවා, බොරු පොරොන්දු දෙනවා විතරයි. අපි දන්නවා ඊපීඩීපී එකේ කැරැට්ටුව. මම හිතන්නේ නැහැ මිනිස්සුන්ගේ තත්ත්වේ හොඳ වෙයි කියලා... අපි දන්නවා මේ ඔක්කොම පක්ෂ ගැන. ඡන්දෙට පස්සේ ආන්ඩුව දෙමල මිනිස්සුන්ට තව තවත් හිරිහැර කරන්නයි ඉන්නේ."

© www.wsws.org